*Vidvān - Ruhuna Undergraduate Academic Journal of Pali and Buddhist Studies*
*Volume I , Issue I*
*ISSN: 3121-5033*

# අපරාධය හා දඬුවම පිළිබඳ බෞද්ධ විග්‍රහය

**කලුපහන මධුරවංස හිමි**
**සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශය**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**
Vansamadura@gmail.com

**සාරසංක්ෂේපය**

"අපරාධය හා දඬුවම" යනු පෙර අපරදිග දර්ශනයන්හි සාකච්ඡාවට බඳුන්වන ප්‍රධාන සංකල්පයකි. මේ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී වඩාත් සාර්ථක ඉගැන්වීම් රාශියක් අපරාධය හා දඬුවම බුදුදහමේ අන්තර්ගත බව මනාව පැහැදිලි වේ. අපරාධය හා දඬුවම පිළිබඳ නූතන අර්ථකථන සහා වර්ගීකරණයට වඩා සාර්ථක අර්ථකථන සහ වර්ගීකරණ බුදුදහමේ විද්‍යාමාන වන බව මෙම අධ්‍යයනයෙන් තහවුරු කර ඇත. බුදුදහමට අනුව අපරාධය යනු කුමක්ද, අපරාධය සමාජ සංස්ථාවන්ගෙන් වෙනස් වන ආකාරය, පුද්ගලයාට අනුව වෙනස් වන ආකාරය ඒ අයුරින්ම දඬුවම් ක්‍රමද ක්‍රියාත්මක වන ආකාරය මැනවින් නිරූපිතය. අපරාධයේ ස්වභාවය අනුව දඬුවම ද තීරණය වන අතර බුදුදහමේ තරම් අපරාධ සහ දඬුවම් ක්‍රම පිළිබඳව සාර්ථක ඉගැන්වීම් ක්‍රමවේදයක් නොමැති බව එහි උගන්වා ඇති අධිකරණ ක්‍රමවේදයන් මගින් මොනවට තහවුරු වේ. තවද එවැනි සාර්ථක දඬුවම් ක්‍රම මගින් අපරාධකරුවා ප්‍රතිශෝධනය කිරීම බුදුදහමේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම් අනුගමනය කරන්නේ නම් නූතන ලෝකයේ රාජ්‍ය පාලනයේ, සමාජ සංස්ථාවන්ගේ සදාචාරාත්මක අගය ඉතා ඉහළින් රඳවා ගැනීමට හැකි වනු ඇත. බුදුදහමේ අනුමත දඬුවම තුළින් දඬුවමට භාජනය වන අපරාධකරුවාගේ මානසික තත්ත්වය කෙරෙහි දඬුවම් පමුණුවන සෑම අවස්ථාවකම අවධානය යොමු කර ඇති බව එහි ඉගැන්වීම් නිදසුන් සපයයි. දඬුවම් පැමිණවීමේදී ද ආචාර සම්පන්නව සිදු කිරීමට බුදුදහමේ මාර්ගෝපදේශ සලසා ඇති අතර එහිදී ද උපරිම සදාචාරාත්මක අගයක් පවත්වා ගැනීමට අවධාරණය කර ඇත. සෑම සමාජ සංස්ථාවකම ආචාර සම්පන්න පුද්ගලයන් බිහිකර ගැනීමට බුදුදහමේ උගන්වන අපරාධයට අනුකූල වන දඬුවම උපකාරී වන බව මෙමගින් සනාථ කරනු ලබයි.

***ප්‍රමුඛපද*** - *අපරාධය, දඬුවම, අධිකරණ, ප්‍රතිශෝධනය, භික්ෂුව*

**Article History**: **Received**: 30.03.2026 **Accepted**: 30.06.2026


*© Editor in Chief: Dr. Ven. Koggalle Wijitha, Editor: Dr. Thusitha Rajapaksha*
*Vidvān, Department of Pali and Buddhist Studies,Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Sri Lanka.*

## 1. හැඳින්වීම

අපරාධය හා දඬුවම යනු එකිනෙකට බැඳී පවතින සංකල්ප දෙකකි. එම සංකල්පය පිළිබඳව බුදුදහමේ දෘෂ්ටිකෝණයෙන් විමසා බලන්නේ නම් පළමුව අපරාධය හා දඬුවම පිළිබඳ නූතන මතය විචාරය කරගත යුතුය. ඒ අනුව නූතනයේ අපරාධය හා දඬුවම විග්‍රහ කර ගනු ලබන්නේ කුමන අයුරින්ද යන්න මෙහිදී විමසීමට අපේක්ෂා කරන අතර ඒ පිළිබඳ බුදුදහමේ දෘෂ්ටිකෝණය කිනම් අයුරින් ප්‍රකට කරන්නේද යන වග අධ්‍යයනය කිරීමට ද මෙමගින් බලාපොරොත්තු වේ. අපරාධය පිළිබඳව නූතනයේ මෙන්ම බෞද්ධ සමාජයේද බෙදා දැක්වීම්ද මෙහිදි විග්‍රහ කර ගනු ලබයි. තවද දඬුවම් කිරීම හා දඬුවමින් බලාපොරොත්තු වන ප්‍රතිශෝධනය කෙතරම් දුරට සමාජ යහපැවැත්මට හා ආචාරධර්ම සුරක්ෂිත කරගැනීමට ඉවහල් වන්නේද යන්න මෙහිදී සාකච්ඡා කළ යුතුය. අවම සදාචාරය පවත්වා ගැනීමටවත් නූතන මිනිසාට බුදුදහමේ අපරාධය හා දඬුවම පිළිබඳ ඉගැන්වීම් උපකාර කරගැනීමේ අරමුණින් සිදුකරනු ලබන අධ්‍යයනයක් වශයෙන් මෙම අධ්‍යයනය හඳුන්වා දිය හැකි ය. තවද ලෝකය තුළ අපරාධ අවම කර ගැනීම හා ප්‍රතිශෝධනාත්මක දඬුවම් ක්‍රම භාවිතයට බුදුදහමේ කුමන අයුරින් මග පෙන්වා ඇත්තේ යන්නද මෙහිදී තවදුරටත් අධ්‍යයනය කිරීම අරමුණු වන බව හඳුන්වා දිය හැකිය.

## 2. සාහිත්‍ය විමර්ශනය

අපරාධය හා දඬුවම පිළිබඳ විමර්ශනය කිරීමේදී බෞද්ධ සමාජ පාලනය හා අපරාධ විද්‍යාව නම් ග්‍රන්ථයේ අර්ථකථන රාශියක් අපරාධය පිළිබඳ දැකිය හැකිවිය. දඬුවම් සංග්‍රහය තුළද අපරාධ යනු කුමක්ද යන්න හඳුන්වා දිය තිබෙන අතර ඊට අදාළ දඬුවම් පිළිබඳව ද සඳහන් කර තිබේ. නන්දසේන රත්නපාල විසින් අපරාධ විද්‍යාවේ මූලධර්ම නම් ග්‍රන්ථයේදී අපරාධ ඇතිවීමට මූලික වෙන හේතු කිහිපයක් අධ්‍යයනය කර ඇත. අපරාධය හා දඬුවම බෞද්ධ අධිකරණ සම්ප්‍රදාය නම් ග්‍රන්ථයේ දී අපරාධය හා දඬුවම් වර්ග කොට දක්වා තිබේ. ආදි බුදු දහමේ පැනෙන නීති දර්ශනය නම් ග්‍රන්ථයේ දී ලලිත් රණසිංහයන් විසින් ද බුදුදහමේ උගන්වන ප්‍රධාන අපරාධ හා ඒවා විනිශ්චය කිරීම සිදුකළ යුතු ආකාරය සවිස්තරාත්මකව පෙන්වා ඇත. උක්ත මූලාශ්‍රවලට අමතරව විනය පිටකය, අංගුත්තර නිකාය, දීඝ නිකාය ආදී ත්‍රිපිටකාගත මූලාශ්‍රය මගින් ද අපරාධය හා දඬුවම පිළිබඳ බෞද්ධ විග්‍රහය විශ්ලේෂණය කිරීම සිදු විය. ඒ අනුව මේ පිළිබඳව ප්‍රමාණාත්මක සාහිත්‍ය මූලාශ්‍ර තොරතුරු රාශියක් විමර්ශනාත්මකව සම්පිණ්ඩනය කරමින් පුද්ගලයාගේ අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධිය සඳහා උපයෝගී කරගත යුතු ආකාරය පිළිබඳව මෙම අධ්‍යයනය තුළින් අවධාරණය කර ඇත.

**3. පර්යේෂණ ගැටලුව**

පුද්ගලයාගේ බාහිර හා අභ්‍යන්තර ප්‍රතිසංවිධානය සඳහා බුදුදහමේ ඉගැන්වෙන අපරාධය හා දඬුවම පිළිබඳ ඉගැන්වීම බලපානු ලබන්නේ කෙසේද?

**4. පර්යේෂණ අරමුණ**

නූතනයේ සාකච්ඡා කරනු ලබන අපරාධය හා දඬුවම නම් සංකල්පය පිළිබඳ බුදුදහමේ එන ඉගැන්වීම් අධ්‍යයනය කරලීම මඟින් නූතන අපරාධ වළක්වා ගැනීමටත්, අපරාධකරුවන් දඬුවම මඟින් ප්‍රතිශෝධනය වන්නේ ද යන්න සාකච්ඡා කිරීම මෙහි මූලික පරමාර්ථය යි.

**5. පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණ මාතෘකාව අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණාත්මක දත්ත හා ගුණාත්මක දත්ත උපයෝගී කරගැනීමේ අරමුණින් සාහිත්‍ය මූලාශ්‍රය හෙවත් මූලාශ්‍රය ග්‍රන්ථ අධ්‍යයනය කරන ලදි. ඒ අතර ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියක මූලාශ්‍රය උපයෝගී කරගන්නා ලදී.

**6. සාකච්ඡාව හා ප්‍රතිඵල**

**6.1 අපරාධය හා දඬුවම පිළිබඳ නූතන විග්‍රහය**

අපරාධය හා දඬුවම පිළිබඳ බුදු දහමේ දෘෂ්ටියෙන් විමසා බැලීමට නම් පළමු කොට අපරාධය හා දඬුවම කුමක්ද යන්න විග්‍රහ කර ගත යුතුව ඇත. ඒ අනුව නූතනයේ අපරාධය යන්න විවිධ මූලාශ්‍ර තුළ නිර්වචනය වී ඇති ආකාරය විමසුම් ඇසින් නිරීක්ෂණය කළ විට පිළිබිඹු වේ.

- අපරාධය යන්න බ්‍රිතාන්‍ය විශ්ව කෝෂයේ අර්ථ නිරූපණය කර ඇත්තේ ''අපරාධයක් නම් නීති සිද්ධාන්තයන් තුල අපරාධ නීතියෙන් තහනම් කරනු ලැබූ මානව චර්යාවේ කියා අංශයකි. (අභයසුන්දර, 2002: පි. 20) යනුවෙනි.

- අපරාධය යන්න ඇමෙරිකානු විශ්ව කෝෂයෙහි ''සමාජයක් විසින් නීතියෙන් තහනම් කරනු ලබන ක්‍රියා අපරාධ" (අභයසුන්දර, 2002: පි. 20)

යනුවෙන් පෙන්වා දෙනු ලබයි. මීට අමතරව දණ්ඩනීති සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේදී ද අපරාධයක් යනු කුමක්ද යන්න නිර්වචනය කර තිබෙනු දැකගත හැකිය. එනම්

''අපරාධයක් යනු ලිඛිත නීතිය උල්ලංඝනය කරන පුද්ගලයන්ට හෝ සමාජයට හානියක් සිදුකරනන සහ රාජ්‍ය විසින් දඬුවම් ලැබිය හැකි හිතාමතා කරන ලද ක්‍රියාවක් හෝ අතපසු කිරීමක් වශයෙනි.''

(දණ්ඩනීති සංග්‍රහය, 1998 : පි. 290)

මේ අනුව බලන කල අපරාධයේ ස්වභාවය හා හැඩය හඳුනාගැනීමට ඉතා පහසුය. එනම් නීතියෙන් තහනම් කරනු ලැබූ සියල්ල අපරාධ වශයෙන් වර්ග කළ හැකි බවයි. එසේ වර්ග කරන ලද අපරාධ ප්‍රධාන වශයෙන් ආකාර තුනකින් විග්‍රහ කළ හැකි බව ඩේවිඩ් කරුණාරත්න මහතා පෙන්වා දී ඇත.

1. රාජ්‍ය පිළිබඳ අපරාධ
2. පුද්ගලයන් පිළිබඳ අපරාධ
3. දේපළ පිළිබඳ අපරාධ (අභයසුන්දර, 2002: පි.37)

මෙහිදී රාජ්‍ය පිළිබඳ අපරාධ වශයෙන් හඳුන්වන්නේ රාජ්‍යයට විරුද්ධව සිදු කරන ලද ක්‍රියා වේ. ඒ අතර රාජ්‍ය ද්‍රෝහී ක්‍රියා පෙන්වා දී ඇත. පුද්ගලයන් පිළිබඳ අපරාධ යනුවෙන් හඳුන්වනු ලබන්නේ මිනීමැරුම්, අනියම් මිනීමැරුම්, සියදිවි හානි කර ගැනීමට තැත් කිරීම, බරපතල තුවාල කිරීම හා පහරදීම් ස්ත්‍රී දූෂණ ආදී ක්‍රියාය. තවද දේපළ පිළිබඳ අපරාධ වශයෙන් ගෙවල් බිඳීම, සොරකම් කිරීම, ආදී ක්‍රියා පිළිබඳ කරුණු දක්වයි. මීට අමතරව ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය තුල ද අපරාධ 35ක් දක්වා තිබෙනු දැක ගත හැකි ය. තවද අපරාධ විද්‍යාවේ මූලධර්ම නම් ග්‍රන්ථයේ දී නන්දසේන රත්නපාල මහතා පෙන්වා දෙනු ලබන අපරාධ වර්ග නවයක් පිළිබඳ කරුණු දක්වා තිබේ. ඒවා නම්,

- ප්‍රචණ්ඩකාරී අපරාධ
- දේපළවලට එරෙහි වූ අපරාධ
- සංවිධානාත්මක අපරාධ
- වෘත්තිමය අපරාධ
- ඉහළ පන්තිවල අපරාධ
- ලිංගික අපරාධ
- ගොදුරු විරහිත අපරාධ
- රාජ්‍ය හා සම්බන්ධ අපරාධ
- බාලාපරාධ (නන්දසේන, 1990 : පි. 144)

මේ අයුරින් අපරාධ විවිධ වර්ග යටතේ විවිධ සමාජ කණ්ඩායම් වලට විවිධාකාරයෙන් බලපාන බව ද ඒ පිළිබඳ අධ්‍යයනයෙන් මොනවට පසක් වන්නකි. අපරාධය කරන්නා අනුව හා අපරාධයට ගොදුරුවන්නා අනුවද අපරාධයේ ස්වභාවය අඩු වැඩි වෙන බව ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් තහවුරු වේ. මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා විසින් අපරාධ ඇතිවීමට මූලික වන දෘෂ්ටිකෝණ හතරක් පිළිබඳව දක්වා තිබේ. එනම්

1. පරිමාණවාදී දෘෂ්ටිකෝණය

2. දේශපාලන හා ආර්ථික දෘෂ්ටිකෝණය

3. සමාජ මානසික දෘෂ්ටිකෝණය

4. කර්ම දෘෂ්ඨිකෝණය (නන්දසේන, 1990 : පි. 47)

යනුවෙනි. ඒ අනුව විමසන කල මිනිසාගේ පරිණාමය සමග හා දේශපාලන ආර්ථික බිඳවැටීම් සමාජ මානසික තත්ත්වයන් මුල්වීම් හා කර්මානුරූපීව අපරාධ ඇතිවීම හා අපරාධවලට ගොදුරු වීම සිදුවන බවට තර්ක කර ඇත. ඒ අනුව කරුණු විමර්ශනය කිරීමේදී අපරාධ වළක්වා ගැනීම සඳහා නීති සකස් විය යුතු අතර දඬුවම් ක්‍රියාත්මක කිරීම මගින් අපරාධ අවම කර ගැනීම හා වළක්වා ගැනීමට හැකි වනු ඇත.

අපරාධය හා දඬුවම් යන සංකල්ප දෙකම නීතිය විසින් සාකච්ඡා කරනු ලබන සංකල්ප දෙකකි. ඒ අනුව දඬුවම යනුවෙන් හඳුන්වනු ලබන්නේ යම් කිසි ආකාරයකින් සිදු කරන ලද අපරාධයකට කිසියම් ආකාරයක වන්දි ගෙවීමක් ලෙසය. දඬුවම හිමි වන්නේ අපරාධකරුවාට පමණි. ඒ බව යම්කිසි නියෝගයකින් සිදු කරනු ලබන්නකි. එම නියෝගය හෙවත් දඬුවම කිසියම් ආකාරයකට අත්විඳීමට සිදුවන බව අනිවාර්ය වේ. මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා පුද්ගලයාට දඬුවම් විඳීමට ලැබෙන අවස්ථා තුනක් පිළිබඳව පෙන්වා දෙනු ලබයි.

1. නීතිමය අවස්ථාව

2. සමාජමය අවස්ථාව

3. ආධ්‍යාත්මික අවස්ථාව (නන්දසේන, 2006 : පි. 20)

මෙහි දී නීතිමය අවස්ථාව මගින් දඬුවම් ලබා දෙනුයේ උසාවිය හෝ අධිකරණය හෙවත් රාජ්‍යක පවත්නා නීතීන් යටතේ සිදු කරනු ලබන දඬුවමයි. ඒ අතර දඩ මුදල් ගෙවීම, සිර දඬුවම් ලැබීම, ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබීම, මරණ දඬුවම ලැබීම, පොදු සේවයේ යෙදීවීම යනාදිය දඬුවම් වශයෙන් පවරනු ලබයි. සමාජමය අවස්ථාව යනුවෙන් පෙන්වා දී ඇත්තේ වරදක් කල අපරාධකරුවෙකුට තමා ජීවත් වන සමාජයේ සාමාජිකයන් තුළින් විඳින්නට සිදු වන නින්දා අපහාස හා සමාජ අපවාද, ගැරහිලි වැනි දඬුවම් වේ. දඬුවම් ලැබෙන ආධ්‍යාත්මික අවස්ථාව වන්නේ ස්වභාව දහම මුල්වීම හෙවත් කර්මානුරූපීව ලැබෙන දඬුවම වේ.

ඒ අනුව අපරාධයට අනුකූල වන ආකාරයට හා ප්‍රමාණයට අනුව දඬුවම තීරණය වන අතර ඉහත දැක්වූ දඬුවම් අවස්ථාවන්හි අපරාධකරුවාට දඬුවමින් ගැලවිය නොහැකි බව පැහැදිලි වේ. ඒ බව ජර්මානු ජාතිකයෙකු වූ එමානුවෙල් කාන්ට් නම් දාර්ශනිකයා "සෑම අපරාධකරුවෙකුටම දඬුවම් දිය යුතුයි" (එදිරිසිංහ, 2002 : පි. 223) යනුවෙන් ප්‍රකාශ කිරීමෙන් ද පැහැදිලි වේ. මෙසේ දඬුවම් කිරීම මඟින් බලාපොරොත්තු වන්නේ ප්‍රති හිංසාව හෙවත් කළ වරදට සුදුසු ප්‍රතිචාරයක් දැක්වීමත්, අනාගතයේ අපරාධ වැළැක්වීම, අපරාධකරු සදාචාරවත් කිරීම හා සමාජය තුළින් අපරාධ වැළැක්වීම හෙවත් සමාජ ආරක්ෂාව ලබා දීම යන කරුණු ය. අතීතයේ පටන් එනම් රජවරුන් රාජ්‍ය පාලනය කරන සමයේ පටන් මේ දක්වා උක්ත සඳහන් දඬුවම් ක්‍රම යම් යම් ආකාරය අයට සංශෝධනය කරමින් ක්‍රියාත්මක වේ. දඬුවම රටින් රටට, සමාජයෙන් සමාජයට, ආගමෙන් ආගමට, නීතියෙන් නීතියට අනුව වෙනස් වන බව මෙහිදී අවධාරණය කළ යුතුය. තවද දඬුවම ක්‍රියාත්මක වන්නේ අපරාධයේ ස්වභාවය අනූව බවත් අපරාධයේ ප්‍රතිඵලය දඬුවම බවත් මොනවට පසක් වේ.

## 6.2 අපරාධය හා දඬුවම පිළිබඳ බුදුදහමේ විග්‍රහය

බුදුදහම තුළ අපරාධය හා දඬුවම පිළිබඳව වඩාත් උචිත ඉගැන්වීම් දක්නට ලැබෙන්නේ විනය පිටකයේ බව ඒ පිළිබඳ අධ්‍යයනයෙන් පැහැදිලි වේ. එහිදී අපරාධයට අනුව දඬුවම් පැමිණවීමේ ක්‍රමවේදයක් බුදුරජාණන් වහන්සේ විසින් පනවා ඇති බව පෙනී යයි. එම පැනවීම් සිදුකර ඇත්තේ භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන් වහන්සේලා උදෙසා වන අතර ගිහියන් උදෙසා ද අපරාධ කරන්නේ නම් දඬුවම් ලෙස කර්ම විපාක විඳීමට සිදු වන බව විවිධ අවස්ථාවන්හි පෙන්වා දී තිබෙනු දැක ගත හැකිය.

බුදු දහමට අනුව අපරාධය වර්ගීකරණය කර තිබෙනුයේ තමා නියෝජනය කරනු ලබන සමාජ තත්ත්වය හෙවත් ස්වභාවය අනුව බව පෙනේ. භික්ෂු සමාජය තුළ ද සාමණේර භික්ෂූන් අතින් සිදුවන අපරාධ වශයෙන් පණවනු ලබන්නේ දස ශික්ෂාපද කඩ කිරීම යි. නමුදු උපසපන් භික්ෂූන් වහන්සේලා ශික්ෂාපද 227ක් කඩ කිරීමෙන් අපරාධ හෙවත් විනය නීති කඩකිරීමක් සිදුවන බව විනය පිටකය තුළ අවධාරණය කර ඇත. ඒ අනුව විනය නීති කඩ කිරීමෙන් සිදුවන බරපතලම අපරාධ වශයෙන් පෙන්වා දෙනු ලබන්නේ සතර පාරාජිකාවට පත් වීමයි. එනම්

1. මේථුන ධම්ම පාරාජිකාව
2. අදත්තාදාන පාරාජිකාව
3. මනුස්සවිග්ගහා පාරාජිකාව
4. උත්තරි මනුස්ස ධම්ම පාරාජිකාව

(පාරාජිකා පාළිය, 2006 : පි. 49)

යන කරුණු සතරයි. මෙය ගිහි සමාජයේ පංචශීල ප්‍රතිපදාවට වඩාත් සමීප බව පෙනී යයි. ප්‍රාණඝාතය හෙවත් පර පණ නැසීම, ඊට අනු බල දීම, මරණය වර්ණනා කිරීම බුදු දහමට අනුව වරදකි. තවද සොරකම් කීම හා නැති ගුණ පවසමින් බොරු කීම ද බරපතල වරදක් සේ පිළිගැනේ. ඒ උපසපන් භික්ෂුවක් සිදු කරන්නේ නම් වඩාත් බරපතල අපරාධයක් බව බුදුදහම අවධාරණය කරයි. මෙම අපරාධ සතර ම හා සමාන වන සතර කර්ම ක්ලේශ හා පංචසීල ප්‍රතිපදාවද ගිහි සමාජය සඳහා නිර්දේශිත වේ. මීට අමතරව පංචානන්තරීය පාපකර්ම වශයෙන් සලකනු ලබන

1. මව මැරීම
2. පියා මැරීම
3. රහතුන් මැරීම
4. බුදුන්ගේ ලේ සෙලවීම
5. සංඝභේදය (අංගුත්තර නිකාය, 2005 ꞉ පි. 240)

යන කරුණු පහෙන් පළමු කරුණු තුනම ප්‍රාණඝාතයට සම්බන්ධවෙයි. එහිදී පංචානන්තරිය පාපකර්ම වලින් සිදුවන ප්‍රාණඝාතය අනෙකුත් ප්‍රාණඝාතයට වඩා බරපතළ බව බුදු දහමේ පෙන්වා දෙනු ලබයි. ඕනෑම නීතියකට අනුව ප්‍රාණඝාතය යනු දරුණු ගනයේ අපරාධයකි. යම්කිසි භික්ෂුවක් ප්‍රාණඝාතය සිදු කිරීමට අණ කරන්නේ නම් හෝ ප්‍රාණඝාතය යම් තැනකදි වර්ණනා කරන්නේ නම් උන්වහන්සේගේ පැවිද්ද අහිමිවී යයි. එය කඳ තිබියදී හිස වෙන් කිරීමක් වැනිය. පාරාජිකා සතරටම හිමි වන දඬුවම එය බැවින් විනය පිටකයේ සතර පාරාජිකා පැවිදි සමාජයේ බරපතලම අපරාධ වශයෙන් පෙන්වා දිය හැකිය. ඉන් ගම්‍ය වනුයේ අපරාධයේ ස්වභාවය හෙවත් හැඩය අනුව දඬුවම් ක්‍රියාත්මක කිරීම බුදුදහමේ ක්‍රමවේදය බවයි.

මීට අමතරව විනය පිටකය තුල බරපතල අපරාධ ලෙස මතුකර දක්වා ඇත්තේ සංඝාදිසේස 13 යි. මෙම සංඝාදිසේස අපරාධ කරන භික්ෂූන්ට දඬුවම් ක්‍රමයක් වශයෙන් පරිවාස දඬුවම් හිමි වේ.

තවද විනය පිටකය තුළ සඳහන් වන පරිදි බෞද්ධ පැවිදි සමාජය වඩාත් ආචාරශීලී සංස්ථාවක් බවට ප්‍රකට කිරීම සඳහා නිස්සග්ගීය පාචිත්තිය 30ක් විනය තුළ පනවා ඇත. එහිදී පොදුවේ පරිහරණය කළ යුතු දේ පෞද්ගලික පරිහරණය කිරීම හා අනවශ්‍ය අධිපරිභෝජනවාදී ක්‍රමය වළකාලීමේ අරමුණින් එම විනය නීති අපරාධ වශයෙන් තහනම් කර ඇති බව පෙන්වා දිය හැකිය. මෙම නිස්සග්ගීය පාචිත්තිය කඩ කිරීම භික්ෂු සංස්ථාවට අනුව අපරාධ වශයෙන් පෙන්වා දිය හැකිය.

උක්ත සඳහන් කරන ලද නිස්සග්ගිය පාචිත්තිය හැරුණු කොට පාචිත්තිය 92ක් පිළිබඳව විනය නීති පනවා තිබේ. එහිදී භික්‍ෂු සංස්ථාව තුළ ගිහි පැවිදි සමාජ සබඳතා පැවැත්වීම පිළිබඳ කටයුතු කිරීමේදී සිදුවිය හැකි අපරාධ පිළිබඳව නීති සම්පාදනය

වී ඇති බව පෙන්වා දිය හැකිය. තවද සිවුපස පරිභෝජන ක්‍රමය විනය නීති ඉක්මවා සිදු කිරීම අපරාධ වශයෙන් භික්ෂු සමාජය තුළ අවධාරණය වේ. භික්ෂු සමාජය සෑම විටම ගිහි සමාජයට ආදර්ශයක් විය යුතු බැවින් භික්ෂුව තුළින් කුඩා හෝ අපරාධයක් සිදු නොවීම සඳහා මෙම පාචිත්තිය ශික්ෂා පද පනවා ඇති බවට කරුණු පසක් වේ.

භික්ෂුව විසින් ගිහි සමාජය අපහසුතාවයට හා අසරණභාවයට පත්වීමට ඉඩ ඇති බැවින් පාටිදේසනීය ශික්ෂාපද පනවා ඇති බවට පැහැදිලි වේ. භික්ෂූන් වහන්සේලා තුළ උපරිම සදාචාරයක් පැවැත්වීමට නම් ඉතා කුඩා වැරැද්ද පිළිබඳ වුවද අවධානය යොමු වන මෙම පාටිදේසනීය ශික්ෂා පද උපකාර වේ. මීට අමතරව සේඛියා ශික්ෂාද 75ක් පමණ භික්ෂූන් වහන්සේලාට පනවා ඇති අතර මෙම සේඛියා ශික්ෂා අපරාද ලෙස පෙන්වා දිය හැක්කේ මේවා කඩ කිරීම තුළ චර්යා ධර්ම හා සදාචාර සම්පන්න භික්ෂු සමාජය පරිහානියට පත්වන නිසා යැයි සිතිය හැකිය. විනය පිටකයේ පනවන ලද සේඛියා ශික්ෂාපද සියල්ලක් ම පාහේ සමාජ සදාචාරය හා පුද්ගලචර්යා ධර්ම පවත්වා ගැනීම උදෙසා පනවා ඇති බව පැහැදිලි වන අතර මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා මෙම සේඛියා ශික්ෂාපද තුන් ආකාරයකට වර්ගීකරණයකට කොට බෙදා දක්ව යි.

1. ගිහි ගෙදරකට යන විට හා ආහාර ලබා ගැනීමේ හා වැළඳීම පිළිබඳ විනය

2. තථාගතයන් වහන්සේගේ ධර්මය ඉගැන්විය යුතු සැටි හා පවත්වා ගෙන යන ආකාරය

3. වැසිකිලි කැසිකිළි භාවිතයේදී ඇති වැරදි කරුණු (නන්දසේන, රත්නපාල. 2006 : පි. 65)

මෙම බෙදීම තුළින් තහවුරු වන්නේ ශාසන පරිහානියට හේතු වන සියලු ක්‍රියා අපරාධ ක්‍රියාවන්ට සමාන බවයි. බුදුසමය වඩාත් අගය කරනු ලබන චර්යා ධර්ම හෙවත් සදාචාර සම්පන්න ජීවිතය විනය පිටකයේ පනවා ඇති ශික්ෂාවන් පිළිබඳ විමසීමෙන් මනාව තහවුරු වේ.

බුදුදහමේ අපරාධය වර්ග වන්නේ පුද්ගලයා නියෝජනය කරනු ලබන සමාජ තත්ත්වය අනුව බව ඒ බව අධ්‍යයනය කිරීමෙන් තහවුරු වේ. ඒ අනුව භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනුවෙන් බෙදා දක්වන බෞද්ධ සමාජය ගිහි පැවිදි වශයෙන් වෙන් වෙන්ව අපරාධ නොකිරීමට වග බලා ගත යුතුවේ. එහි දී ගිහි සමාජයට සිඟාලෝවාද සූත්‍රයේ දී අපරාධ යනු කුමක්ද යන්න මැනවින් වර්ග කොට දක්වා තිබෙනු දැක ගත හැකිය. එහිදී වඩාත් ස්මතු වන්නේ සතර කර්ම ක්ලේශ පිළිබඳව යි.

1. ප්‍රාණඝාතය

2. අදත්තාදානය

3. කාමමිථ්‍යාචාරය

4. මුසාවාදය (දීඝ නිකාය, 2005: පි. 09)

යන සතර කර්මක්ලේශයන් ගිහි සමාජය සිදුකරනු ලබන බරපතලම අපරාධ වග සිඟාලෝවාද සූත්‍රයේ දී ඉස්මතු කර තිබේ. එහි දක්වන පරිදි යමකට ඇති දැඩි කැමැත්ත බිය, මෝහය, ද්වේෂය යන කරුණු මුල් වීමෙන් එනම් සතර අපරාධ සිදුවන්නට හැකි බව පෙන්වා දී ඇත. එනම් සතර අගතියට පත් වීම යි. ඒ අනුව පාරාජිකා පාලියේදී භික්ෂූන් අතින් සිදු වන බරපතළම අපරාධ වන්නේ සතර පාරාජිකා බවත් ගිහියන් අතින් සිදුවන බරපතළම අපරාධ වන්නේ සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් සතර කර්ම ක්ලේශ බවත් තහවුරු වේ.

දෙපාර්ශවය තුළින්ම නොවිය යුතු අපරාධ නම් පංච ආනන්තරිය පාපකර්ම බව අවධාරණය කරන බුදුසමය පංචානන්තරිය පාපකර්ම සිදු කරන්නාට පිළියම් කොට නොහැකි බව අංගුත්තරනිකායේ පරිකුප්ප සූත්‍රයේදී සඳහන් කර ඇත.

මෙසේ කරුණු අධ්‍යයනයෙන් තහවුරු වනුයේ බුදුදහම තුළ අපරාධ වළක්වා ගැනීමට නම් ශීලය ආරක්ෂා කර ගත යුතු බවයි. එමගින් සියලු ආකාරයේ අපරාධ වළක්වා ගැනීමට බුදුදහමේ උගන්වන සීලය පදනම් වන බව මොනවට පසක් වේ.

අපරාධයට අනුව දඬුවම ද උරුම වන අයුරු හා නියම කර ඇති අයුරු බුදු දහමින් විද්‍යාමාන වේ. බෞද්ධ සමාජය තුළ දඬුවම් කිරීම වඩාත් ක්‍රමවත්ව නිර්මාණය වී ඇත්තේ පැවිදි සමාජය මුල් කරගෙන බවට පෙනී යයි. පැවිද්දන් විසින් සිදු කරනු ලබන සෑම අපරාධයක් සඳහාම දඬුවම් කිරීම සඳහා අධිකරණ ක්‍රමයක් තිබූ බව චුල්ලවග්ගපාලියේ එන සමතක්ඛන්ධකයෙන් පැහැදිලි වේ. එහිදී අපරාධ සිදු වූ විට ඒවා නිරාකරණය කර ගැනීම සඳහා අධිකරණ ක්‍රම හතක් ගැන කරුණු සඳහන් කර ඇත. එනම්

1. සම්මුඛා විනය
2. සති විනය
3. අමුළ්හ විනය
4. පටිඤ්ඤාතකරණ
5. යේභූයසික
6. තස්සපාපියයසක
7. තිණවත්ථාරක (චුල්ලවග්ගපාළිය, 2006 : පි. 158 )

යන විනිශ්චයන් දැක ගත හැකි ය. එහිදී සම්මුඛා විනය මගින් සිදු කරනු ලබන්නේ චූදිත චෝදකයන් සංඝයා හමුවට ගෙන්වා ප්‍රශ්න විසඳීමෙන් කරනු ලබන සමථය යි. සති විනය නමින් හඳුන්වනු ලබන්නේ වරද කළ භික්ෂුවට සංඝයා වහන්සේ විසින් ඤත්තිචතුත්ථ කර්ම වාක්‍යයෙන් කරනු ලබන විනිශ්චය වේ.

අමූළ්හ විනය යනු උමතු වූ භික්ෂුව කරන ලද වරදට ප්‍රකෘතියට පත් වූ පසු විනිශ්චය කිරීමයි. අදාළ භික්ෂුව නිදහස් කර ගැනීම සඳහා ගැනෙන කියා මාර්ගය මෙමගින් සිදුවේ. පටිඤ්ඤාතකරන මගින් සිදුවන්නේ වැරදි නොකළ භික්ෂූන් විනිශ්චය කිරීම යි. යේභුය්‍යසික යනුවෙන් පෙන්වා දෙනු ලබන්නේ ධර්මවාදී වැඩි දෙනාගේ අදහසට අනුව සිදු කරන අධිකරණ සමථයයි. තස්සපාපිභාසිකා යනු පාපයන් උත්සන්න වූ පුද්ගලයා මුල් කර ගනිමින් ඤත්ති චතුත්ත කර්මයෙන් සිදු කරනු ලබන විනිශ්චය වේ. තිණවත්ථාරක යනු යම් ප්‍රශ්නයක මූල කාරණාව වහන් කරමින් සිදු කරනු ලබන විනිශ්චයක් වේ. මේ අනුව කරුණු විනිශ්චය කිරීමේදී අපරාධ සඳහා දඬුවම් නියම කිරීමට වඩා ක්‍රමවත් ආකාරයේ විනිශ්චය ක්‍රමවේදයක් බුදුදහමේ අන්තර්ගත බව පැහැදිලි ය. තවද මෙම විනිශ්චයන් සඳහා යොමු විය යුතු අධිකරණ ක්‍රම සතරක් පිළිබඳව මෙහි සඳහන් කර තිබේ.

- විවදාධිකරණ
- අනුවාදාධිකරණ
- ආපත්තාධිකරණ
- කිච්ඡාදීකරණ (සමථක්ඛන්ධකය, 2005: පි. 163)

මෙහිදී විවාදාධිකරණ යනුවෙන් දක්වන්නේ භික්ෂුන් වහන්සේලා අතර ධර්මය පිළිබඳව ඇතිවන විවාදය යි. අනුවාදාධිකරණ යනු භික්ෂුවක් භික්ෂුවකට සීල විපත්තියෙන් හෝ ආචාර විපත්තියෙන් හෝ දිට්ඨි විපත්තියෙන් හෝ ආජීව විපත්තියෙන් යන විපත්තීන්ගෙන් උපවාද කිරීම යි. ආපාත්තාධිකරණ යනු පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට යන පස් වැදෑරුම් ආපත්තීන් හා සත්වැදෑරුම් ආකාර වූ ආපත්තිස්ඛන්ධ යන මේවා ආපත්තාධිකරණ වේ. කිච්චාදීකරණ යනු අපලෝකන කර්මය, ඤත්ති කර්මය, ඤත්ති දුතිය කර්මය, ඤත්තිචතුත්ථ කර්මය යන කර්මයන් සිදුකිරීම තුළින් සිදු කරනු ලබන අධිකරණය යි. මින් පෙනී යන්නේ ද බෞද්ධ භික්ෂු සමාජය තුළ අපරාධ කරන්නන් සඳහා වෙන් වෙන් වශයෙන් අධිකරණ ක්‍රම මගින් දඬුවම් පමුණුවන බව යි. දඬුවම තීරණය වන්නේ ද අපරාධයේ ප්‍රමාණයට අනුව බව මොනවට පැහැදිලි වේ.

සමාජයේ ලබා දෙන දරුණුම දඬුවම නම් සතර පාරාජිකා මුල් කර ගනිමින් සිදු කරන පැවිද්ද අහිමි කරවීමයි. ඊට අමතරව සංඝාදිසේස ආදී පසුවට එන සුළු අපරාධ සඳහා දඬුවම් ක්‍රම නවයක් බුදුසමය හඳුන්වා දී ඇත.

1. තජ්ජනීය කර්මය
2. නිස්සය කර්මය
3. පබ්බාජනීය කර්මය
4. පටිසාරණීය කර්මය

5. උක්ඛේපනීය කර්මය
6. සමණුභාෂණ කර්මය
7. නිස්සාරණ කර්මය
8. පත්ත නික්කුජ්ජන කර්මය
9. බ්‍රහ්ම දණ්ඩනය (සමථක්ඛන්ධකය, 2005 : පි. 82)

පැවිදි සමාජයේ තරම් විධිමත් දඬුවම් ක්‍රමයක් පෙර අපරදිග කිසිදු දර්ශනයකින් දැකගත නොහැකි බව මින් අනාවරණය වේ. මෙම දඬුවම් ක්‍රම පිළිබඳ විමසීමේදී තර්ජනීය කර්ම දඬුවම් ක්‍රමය මගින් සිදුවන්නේ අපරාධ කළ භික්ෂුව සංඝයා මැදට ගෙන චෝදනා කර කරන ලද වැරදි මතක් කර දීම වේ. තවද නිස්සය කර්ම දඬුවම් ක්‍රමය මගින් එම වැරදි සිදු කරන භික්ෂූන් නිස සමාදන් කරවීමෙන් දඬුවම් පමුණුවනු ලැබේ. පබ්බාජනීය දඬුවම් ක්‍රමය ප්‍රධාන දඬුවම් ක්‍රමයක් ලෙස පෙන්වා දිය හැකිය. මෙමගින් සිදු කරනු ලබන්නේ අදාළ වැරැද්ද සිදුකළ භික්ෂුව ගමෙන් හා විහාරයෙන් නෙරපා දැමීමයි. තවද පටිසාරණීය දඬුවම් ක්‍රමයද ඉතා සාර්ථක දඬුවම් ක්‍රමයක් ලෙස දැක ගත හැකිය. එමගින් සිදු වන්නේ වරද කළ භික්ෂුවට සඟ පිරිස මැද චෝදනා කිරීමයි. එපමණක් නොව උක්ඛේපනීය විනය කර්මය මගින් සිදුවන සාර්ථක දඬුවම් ක්‍රමයක් දැකගත හැකිය. එනම් අදාළ අපරාධය සිදුකළ භික්ෂුව ප්‍රකෘති භික්ෂූන් සමග එකට වාසය කිරීමට ඉඩ නොදී දඬුවමේ ප්‍රමාණයට අනුව සැපිරිය යුතු වත් සපුරා අවසන් වන තෙක් වෙන්කොට තැබීමයි.

මීට අමතරව සමනුභාෂණ කර්ම නම් දඬුවම් ක්‍රමය මගින් සිදු කරනු ලබන්නේ සංඝ භේද ආදී අපරාධ කිරීමට උත්සාහ කරන භික්ෂූන් වහන්සේලා බලහත්කාරයෙන් හෝ සංඝයා ඉදිරිපිටට රැගෙන විත් අවවාද නොපිළිගන්නා තැන සමණුභාෂණ කර්ම මගින් දඬුවම් පැමිණවීමයි. නිස්සාරණ කර්මයද දඬුවම් ක්‍රම අතරින් මිථ්‍යා දෘෂ්ඨිය ගත් සාමණේර භික්ෂූන් සඳහා ක්‍රියාත්මක කරවන ලද දඬුවම් ක්‍රමයකි. මීට අමතරව පත්තනික්කුජ්ජන කර්මය යනුවෙන් සුවිශේෂී දඬුවම් ක්‍රමයක් ගිහියන් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පනවා ඇත. මෙමගින් සිදුවන්නේ තෙරුවන්ට හා සංඝයාට අපහාස කරන ගිහියාව පිණ්ඩපාතය නොගෙන වර්ජනය කිරීම යි. ඊට අමතරව බ්‍රහ්ම දණ්ඩනයද සුවිශේෂී දඬුවම් ක්‍රමයක් ලෙස පෙන්වා දිය හැකි ය. මෙහිදී වරද කළ භික්ෂුව සියලු දෙනා විසින් වර්ජනය කර තැබීම මෙහි දඬුවම් ක්‍රමවේදයයි. අවසානයේ දඬුවම නිමවන්නේද එම භික්‍ෂුව සමාව ගෙන දඬුවම් ඉවත් කරනා ලෙස ඉල්ලිම් කල පසුව ය. මේ අයුරින් මෙම සෑම දඬුවම් ක්‍රමයක්ම අවසන් වන්නේ අපරාධ කළ තැනැත්තා වරද පිළිගැනීමෙන් අනතුරුව දඬුවම් විඳ ප්‍රතිශෝධනය වීමෙන් අනතුරුව දඬුවම ඉවත් කරන ලෙස ඉල්ලීම් කල පසුවීමද සුවිශේෂීය.

බුදුදහමේ මෙවැනි දඬුවම් ක්‍රම සඳහන් කර ඇත්තේ පැවිදි සමාජයට වන අතර මේ දඬුවම් ක්‍රියාත්මක කර වීමටද සූවිසි ලක්ෂණයකින් යුක්ත වූ විමසා බලා වැඩ කරන ''අනුවිජ්ජක'' නම් භික්ෂුවක් සිටිය යුතු බව චුල්ලවග්ගපාලියේ දක්වා තිබීමෙන් පැහැදිලි වන්නේ බුදුදහමේ අපරාධ කරන්නන් සඳහා දඬුවම් කිරීමට කෙතරම් අවධානයක් යොමු කළාද යන වගයි. ඒ වග වඩාත් තහවුරු වන්නේ අපරාධ කළත් දඬුවමින් මිදිය යුතු පුද්ගලයන් සය දෙනකු පිළිබඳව බුදු දහමේ සඳහන් කරන බැවිනි. එනම්

1. අජානන

2. අසදිය

3. උම්මත්තක

4. ඛිත්ත ඛිත්ත

5. වේදනට්ඨ

6. ආදිකම්මික (පාරාජිකාපාළිය, 1959 : පි. 83-84)

මෙහිදී අජානන යනුවෙන් පෙන්වා දෙනු ලබන්නේ නොදැනුවත්කම නිසා අපරාධ සිදු කරන පුද්ගලයා යි. අසදිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ ඉවසීම නොමැතිකම නිසා අපරාධ සිදු කරන පුද්ගලයාවයි. උමතුවෙන් අපරාධ කරන පුද්ගලයා උම්මත්තක නම් වේ. ඛිත්ත යනු යක්ෂෝන්මාදයෙන් අපරාධ කරන තැනැත්තයි. වේදනට්ඨ යනු වේදනාවෙන් පීඩිත තැනැත්තා වේ. ආදිකම්මික නම් මුලින්ම වැරද්ද කළ පුද්ගලයාවේ. මේ අයුරින් යුක්ත පුද්ගලයන් කරන අපරාධ සඳහා දඬුවම් කිරීම ප්‍රතික්ෂේප කිරීම තුළින් අවධාරණය වන්නේ දඬුවම් පැමිණවීමේදී කෙතරම් අවබෝධයකින් හා විනිශ්චයකින් යුතුව ඒ කෙරෙහි අවධානය යොමු කළ යුතු ද යන්න යි. තවද අපරාධය විනිශ්චය කිරීමේ දී දඬුවම් පමුණුවන්නා හෙවත් අනුවිජ්ජක භික්ෂූන් වහන්සේ හෙවත් සූවිසි ලක්ෂණයකින් යුක්ත විය යුතුය. එනම්,

1. වත්ථු ජානිතබ්බං - පාරාජිකා, සංඝාදිසේස ආදී ඇවත් පිළිබඳ වස්තු දන්නෙකු විය යුතුය.
2. විපත්තිජානිතබ්බං - ශීල, ආචාර, දෘෂ්ටි, ආජීව යන සතර විපත්තීන් දන්නකු විය යුතු යි.
3. ආපත්ති ජානිතබ්බං - පාරාජිකාදී ඇවැත් වෙන් වෙන් වශයෙන් දන්නකු විය යුතුයි.
4. නිදානංජානිතබ්බා - ආපත්තීන් පිළිබඳ නිධානය දන්නකු විය යුතුයි.
5. ආකාරෝ ජානිතබ්බං - චෝදකාදී ලක්ෂණ දන්නකු විය යුතුයි.

6. පුබ්බාපරං ජානිතබ්බං - මුලින් කී දේ පසුවට ගැලපේ ද, පසුව කී දේ මුලට ගැලපේද ,කරුණු සඟවාද ආදී දේ ගැන දන්නෙකු විය යුතුයි

7. කතාකතං ජානිතබ්බං - කරුණු අනුව විනයෙහි සඳහන් වන පරිදි ඒ වරද කළ නොකළ යුතු බව දන්නෙකු විය යුතුයි.

8. කම්මං ජානිතබ්බං - අපලෝක කර්ම, ඤත්ති කර්ම, ඤත්ති දුතිය කර්ම, ඤත්ති චතුත්ථ කර්ම දන්නකු වියැ යුතුයි.

9. අධිකරණං ජානිතබ්බං - චතුරවිධ වූ අධිකරණ දන්නකු විය යුතුයි.

10. සමථො ජානිතබ්බං - සත්වැදෑරුම් අධිකරණ සමථ දන්නකු විය යුතුයි.

11. න චන්දාගතිං ගන්තබ්බං - ඇති කැමැත්ත නිසා අගතියට නොයා යුතුයි.

12. න දෝසාගතිං ගන්තබ්බං - ද්වේශයෙන් අගතියට නොයා යුතුයි.

13. න මොහාගතිං ගන්තබ්බං - මෝහයෙන් අගතියට නොයා යුතු යි.

14. න භයාගතිං ගන්තබ්බං - භයින් අගතියට නොයා යුතුයි.

15. සංඥාපනීයඨානෙ සංඥාපේතබ්බං - හැඳින්විය යුතු තැන ධර්ම අධර්ම හඳුනන්නෙකු වියයුතුයි.

16. නිජ්ඣාපනීයෙ ඨානෙ නිජ්ඣාපෙතබ්බං - පරීක්ෂා කළ යුතු තන්හි ධර්ම අධර්ම පරික්ෂා කරන්නෙකු විය යුතු ය

17. පෙක්ඛනීයෙ ඨානෙ පසාදෙතබ්බං - පෙන්විය යුතු තන්හි ආපත්තීන් පෙන්වන්නෙකු විය යුතුයි.

18. පසාදනීයෙ ඨානෙ පසාදෙතබ්බං - පැහැදවියැ යුතු තන්හි ධර්මය - අධර්මය යැයි දක්වා පහදවන්නකු විය යුතුයි.

19. ලද්ධපක්ඛො මහී ති අප්පසුතො නාවජානිතබ්බං -ලබන ලද පක්ෂ ඇත්තේ ධර්මය අධර්මය යැයි දක්වන්නකු නොවිය යුතුය.

20. බහුස්සුතොමහීති අප්පසුතො නාවජානිතබ්බං තමා බහුශ්‍රැත යැයි අල්පශ්‍රැතයන් අවඥා කරමින් ධර්මය අධර්මය යැයි දක්වන්නකු නොවිය යුතුය

21. ථෙරොමහීති නවකතරො නාවජානිතබ්බං - තමා ස්ථවිරව , අන්‍යා නවක යයි ආඥා කෙරෙමින් ධර්මය අධර්මය යැයි දක්වන්නකු නොවිය යුතු ය.

22. අසම්පත්තං ව්‍යාහරිතබ්බං - විනිශ්චයට නොපැමිණි කරුණු ඉදිරියට නොගන්නකු විය යුතු ය.

23. සම්පත්තං ධම්මතො විනයතො න පරිහාපෙතබ්බං - විනිශ්චය සඳහා පැමිණි කරුණු ධර්මයෙන් විනයෙන් නොපිරිහෙලන්නකු විය යුතු ය.

24. යෙන ධම්මේන , යෙන විනයෙන , යෙන සත්ථුසාසනේන තං අධිකරණං වූපසම්මති. තථා තං අධිකරණං වූපසමෙතබ්බං - යම් සත්‍ය වූ වස්තුවකින් යම් චෝදනා ඇස්වීමකින්, යම් විනය කර්මයකින් ඒ අධිකරණය සංසිඳෙයි ද එසේ අධිකරණය සංසිඳවන්නෙකු විය යුතුයි.

(රණසිංහ, 2005: පි ,162 - 164 )

යනුවෙන් සුවිසි ලක්ශණයෙන් යුතු බව පෙන්වා දී ඇත. මෙමගින් බුදු දහමේ දඬුවම් ලබා දෙන ආකාරය හෙවත් අපරාධය විනිශ්චය කිරීමේදී කායික දණ්ඩනයෙන් තොර වූ සදාචාරාත්මක හා සාධාරණ විනිශ්චය ක්‍රමයක් හෙවත් දඬුවම් ක්‍රමයක් විද්‍යාමාන වන බව පැහැදිලිය.

උක්ත කරුණු දෙස නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වෙන්නේ බුදුදහමේ පැවිදි සමාජය සඳහා දඬුවම් පමුණුවා ඇත්තේ අපරාධයේ ප්‍රමාණය සලකා බව යි. තවද දඬුවම් විනිශ්චය කළ යුතු ආකාරයද දඬුවම් කරන්නා තුළ තිබිය යුතු සුදුසුකම් පිළිබඳවද අපරාධ සිදු කළත් දඬුවම් නොකළ යුතු පුද්ගලයන් පිළිබඳව ද අවබෝධය ලබා ගනිමින් දඬුවම් කල යුතු ආකාරය මැනවින් විවරණය කර තිබේ. එහෙත් ගිහි සමාජයට දඬුවම් කිරීමට බුදුරජාණන් වහන්සේ විසින් වෙනම ක්‍රමවේදයක් පැහැදිලි කොට නැත. නමුදු පැවිදි සමාජයේ දඬුවම් ක්‍රම දෙස විමසීමෙන් බෞද්ධ රාජ්‍ය පාලනයට හා බෞද්ධ ගිහි සමාජයට දඬුවම් ක්‍රම අනුගමනය කළ හැකි බව පෙනී ය යි. එපමණක් නොව ගිහි සමාජය තුළ ද අපරාධ කරන්නන් දඬුවමට පාත්‍ර වනුයේ මේ ලෝක වශයෙන් පිරිහීමට ලක්වීමෙන් බව බුදු දහම අවධාරණය කර ඇත. තවද සමාජ හිරිහැර, සමාජ අපවාද නින්දා ගැරහුම් අපරාධ කරන්නන්ට නියත වශයෙන්ම හිමිවන බව බුදුරජාණන් වහන්සේ අවධාරණය කර ඇත. එපමණක් නොව පරලෝක වශයෙන් ද කර්ම විපාක විඳීමට සිදුවන බව පෙන්වා දී ඇත. බුදු දහමේ සඳහන් වන සිඟාලෝවාද, පරාභව, වසල, චුල්ලකම්ම විභංග ආදී සූත්‍ර දේශනා පිළිබඳ අවධානය යොමු කිරීමේදී අපරාධ කරන්නන් මේ ලෝක වශයෙන් හා පරලෝක වශයෙන් උරුම කරගන්නා කර්ම විපාක දඬුවම් වශයෙන් මොනවට පිළිඹිබු වේ. උක්ත කරුණු දෙස විමසා බැලීමෙන් පසක් වනුයේ බුදු දහමට අනුව අපරාදයේ ප්‍රතිඵලය දඬුවම බවයි. තවද අපරාධකරුවාට කිසිම මොහොතක දඬුවමින් ගැලවී යාමට නොහැකිය යන යථාර්ථයයි.

## 7. නිගමනය

බුදුදහම අන් කවර දහමකටත් හා දර්ශනයකටත් වඩා අපරාධය හා දඬුවම පිළිබඳව අවධානය යොමු කර ඇති බව පෙනේ. ගිහි පැවිදි වශයෙන් සමාජ සංස්ථා දෙකකට බෙදා දැක්වෙන බෞද්ධ සමාජය තුළ අපරාධය වෙන වෙනම හඳුන්වා දී ඇති බව පෙනී යයි. එහිදී වඩාත් පැවිදි සමාජ සංස්ථාවට සදාචාරාත්මක අගයන් වැඩිවන අයුරින් අපරාධය හා දඬුවම පිළිබඳ කරුණු අවධාරණය කර ඇති බව ඒ පිළිබඳ අධ්‍යයනයෙන් තහවුරු වේ. තවද අපරාධය වර්ගීකරණය කරන බුදුදහම අපරාධයට අනුවම දඬුවම ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කර තිබීම මූලාශ්‍ර මගින් තහවුරු වන්නකි. නූතන ලෝකයේ දඬුවම් ක්‍රමවලට වඩා සාර්ථක දඬුවම් පැමිණවීම් බුදුදහමේ අන්තර්ගතය. එසේ සාර්ථක වන්නේ එම දඬුවම් ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් අපරාධකරුවා ප්‍රතිශෝධනය වීමට ඇති ඉඩකඩ වැඩි බැවිනි. එපමණක් නොව බුදුදහම අපරාධයේ බරපතළකම අපරාධයට ලක්වන පුද්ගලයා හා අපරාධය සිදු කරන පුද්ගලයා අනුව වර්ගීකරණය වන අතර ඒ අනුව දඬුවම් කිරීමේ ක්‍රමය තීරණය කරනු ලබයි. තවද දඬුවම අවසන් වන්නේ අපරාධය කළ පුද්ගලයා වරදට සමාව ගෙන පෙරට වඩා ප්‍රතිශෝධනය වීමෙන් පසුව වීමද සුවිශේෂී වේ. මේ අනුව කරුණු විනිශ්චය කිරීමෙන් තහවුරු වන්නේ නූතන අපරාධ වර්ගීකරණයට සහ ඒ අනුව දඬුවම් පැමිණවීමට බුදුදහම මාර්ගෝපදේශය සලසා ඇති බවයි.

## 8. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**ප්‍රාථමික මූලාශ්‍රය**

අංගුත්තර නිකාය, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පුනර් මුද්‍රණය.
දීඝ නිකාය, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පුනර් මුද්‍රණය.
චුල්ලවග්ග පාළිය, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පුනර් මුද්‍රණය.
පාරාජිකා පාලිය, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පුනර් මුද්‍රණය.

**ද්විතීයක මූලාශ්‍රය**

අභයසුන්දර, ප්‍රණීත්. (2002), බෞද්ධ සමාජ පාලනය හා අපරාධ විද්‍යාව. කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ
එදිරිසිංහ, දයා. පෙරේරා, ඥානදාස. (2002), දාර්ශනික විමර්ශන. දෙහිවල: වත්මා ප්‍රකාශන
දණ්ඩනීති සංග්‍රහය, (1998), කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
රත්නපාල, නන්දසේන (2006), අපරාධය හා දඬුවම බෞද්ධ අධිකරණ සම්ප්‍රදාය. කොළඹ: ආරිය ප්‍රකාශකයෝ
රත්නපාල, නන්දසේන (1990), අපරාධ විද්‍යාවේ මූලධර්ම. කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ
රණසිංහ ල ලලිත් (2005)ආදි බුදුදහමෙහි පැනෙන නීති දර්ශනය .දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය